**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2013**
**-----------------------------------------**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ 25(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායන්ට අදාල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නිති, රිති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත | |
| 14 (1) වගන්තිය | පාලක මණ්ඩල රැස්වීම් සෑම මසකදීම එක් වරක්වත් පැවැත්විය යුතු වුවත් පිළිවෙලින් 2010, 2011, 2012 හා 2013 වර්ෂවල රැස්වීම් 8, 8, 4 හා 3 ක් පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 245 (1) | සහතික කරන නිලධාරීයා විසින් සියළුම වවුචර් පෝරමවල මුද්‍රිත සහතිකය නිවැරදිව පිරවිය යුතු වුවද මුද්‍රණ ආයතනයේ එවැනි මුද්‍රිත සහතිකයක් ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| i. 5.2.1 වගන්තිය | 2010 සිට 2013 දක්වා වර්ෂවල අයවැය ලේඛනය සමඟ පුරෝකථනය කළ ශේෂ පත්‍රයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| ii. 6.5.1 වගන්තිය | ගිණුම් සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. |
| iii. 8.2.2 වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අදාළ |

| | | |
|---|---|---|
| | | ඇමතිවරයාගේ අනුමැතියක් ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී කරන ලද රු.42,140,438 ක මුදල් ආයෝජනය සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය | වටිනාකම රු.25,000 කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අය කළ යුතු වුවත් රු.2,295,475ක ගෙවීම්වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.8,130,690 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,661,089 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.469,601 ක වර්ධනයක් ඇතිවීම සඳහා පාඨමාලා ගාස්තුවල වැඩිවීම හා අනෙකුත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
-----------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 18 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද පවත්වා තිබුණේ පාඨමාලා 07 ක් පමණි. ඒ අනුව ආධුනිකයින් 144 ක් බඳවා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සැලසුම් නොකරන ලද පාඨමාලා 5 ක් සඳහා ආධුනිකයින් 152 ක් බඳවාගෙන තිබුණු අතර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා
--------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුද්‍රණ තාක්ෂණ කළමනාකරණය, දෘශ්‍ය මාධ්‍ය සහ සන්නිවේදනය යන පාඨමාලාවලට අදාළව නිපුණතා ප්‍රමිති හා විෂය නිර්දේශ සම්පාදනය

i අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය යටතේ ප්‍රමිතිකරණ කමිටුවක් පත්කර තිබුණු අතර කමිටුවේ කොන්දේසි පත්‍රයේ (Terms Of References) සඳහන් කාර්යයන් 2013 ජුලි 31 දින වන විට අවසන් කළ යුතුව තිබුණද එලෙස සිදු කර නොතිබුණි.

ii අවශ්‍ය හා අළුතින් මිලදී ගත යුතු යන්ත්‍ර, ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රම, සවි කිරීම් හා ස්ථාන ගත කිරීම්, ඒ සඳහා සම්මත මොඩියුල සංවර්ධනය හා ප්‍රායෝගික වැඩිදියුණු කිරීම් ආදිය සඳහා මාර්ගෝපදේශ ලබාදීම යන කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

iii පාඨමාලාවලට අදාළ විෂය නිර්දේශ, නිපුණතා ප්‍රමිති, යන්ත්‍ර උපකරණ ලැයිස්තුව හා සම්බන්ධිත මොඩියුල ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත් එසේ සිදුකළ බවට තොරතුරු ඉදිරිපත් නොවුණි.

iv 2013 ජුනි 12 දින සිට නොවැම්බර් 01 දින දක්වා කමිටුව 40 වතාවක් රැස්වී තිබුණු අතර එක් සාමාජිකයෙකුට රු.2,500 ක් බැගින් රු.587,500 දීමනාවක් සහ අනෙකුත් වියදම් සඳහා රු.10,607 ක් වශයෙන් රු.598,107 ක වියදමක් දරා තිබුණි. මෙම කමිටුවේ සියළුම සාමාජිකයින් රැස්වී තිබුණේ දින 02 ක් පමණි. සාමාජිකයින් 9-6 ක් අතර සංඛ්‍යාවක් දින 19 ක් ද, සාමාජිකයින් 1-5 සංඛ්‍යාවක් දින 19 ක් සහභාගී වී තිබුණි.

(ආ) සැලසුම් කර තිබුණු පාඨමාලා ආරම්භ කිරීමට ප්‍රමාද වීම නිසා සිසුන් විසින් ගෙවන ලද රු.37,837 ක මුදලක් ඔවුන් ආපසු ලබාගෙන තිබුණි.

(ඇ) මුද්‍රණ ආයතනයේ මූල්‍ය හා පරිපාලන නීතිරීති හා රෙගුලාසි සකස් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා තිබුණද මෙතෙක් ඒවා සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ ලාභය රු.2,570,582 ක් වන විට මාතලේ ශාඛාවේ අලාභය රු.36,080 ක් විය. එහෙත් මාතලේ ශාඛාවේ ඉකුත් වර්ෂයේ ලාභය රු.306,580 ක් විය. මේ අනුව ශාඛාවලින් ආයතනයේ සමස්ත ලාභයට වන බලපෑම අවම මට්ටමක පැවතුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු
------------------------------------

ආයතනයේ ලේකම්වරයාට හා පුහුණු අධ්‍යක්ෂවරයාට පිළිවෙලින් රු.25,000 ක් හා රු.10,000 ක මාසික ඉන්ධන දීමනාවක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලබාදී ඇතත් භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂයේ රු.420,000 ක් ගෙවා තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය
--------------------------------

සමාලෝචිත වර්ෂයේ උපයාගත් ආදායම්වලින් උපයෝජනය නොකර රු.2,422,016 ක මුදල් ශේෂයක් වර්ෂයේ සෑම මාසයකම පැවති බැවින් මෙම මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. මාසය ආරම්භයේ පැවති ශේෂය මාසික වියදමෙන් 4 ගුණයේ සිට 8 ගුණයක්ව පැවති අවස්ථා නිරීක්ෂණය විය.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති
--------------------

නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2004 දෙසැම්බර් 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු අතර ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් කිරීමට 2009 වර්ෂයේදී රු.227,370 ක් වැය කර තිබුණි. ඉඩම පවරා ගැනීම 2013 සැප්තැම්බර් 18 දින සිදු කර තිබුණ නමුත් ගොඩනැගිල්ල ඉදිකිරීම 2014 සැප්තැම්බර් දක්වාම ආරම්භ කර නොතිබුණි.

4.6 කාර්යය මණ්ඩල පරිපාලනය

2013 වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 13 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 11 දෙනෙකු වීමෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 02 ක් විය. සමාලෝචිත වර්ෂයේද පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීමේ කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා එක් එක් අංශ අතර උප ඉලක්කයන් නියමිතව දක්වා නොතිබුණු අතර දක්වා ඇති උපාය මාර්ග සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය සහ ඒ සඳහා වූ වියදම් හා ආදායම් දක්වා නොතිබුණු අවස්ථා විය.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය කළමනාකරණය
(ඇ) අයවැය පාලනය
(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය